# සංස්කෘතිකාංගයක් වන ග්‍රාමීය මිථ්‍යා විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් කිහිපයක් ඇසුරින්)

*එල්.ඒ.ආර්.එස්.එන්. ලියනආරච්චි* [1]

මිථ්‍යා විශ්වාස වූ කලි මිනිසා විසින් ගොඩනගා ගත් කළ යුතු දෑ සහ නොකළ යුතු දෑ වල එකතුවක් ලෙස දැක්විය හැකි ය. මේවා එක් එක් පුද්ගලයාගේ විශ්වාසය මත රඳා පවතී. කෙසේ වෙතත් විද්‍යාව එතරම් දියුණු මට්ටමක නොමැති කාලවකවානුවක දී මිථ්‍යාව රජ කරන ලදී. එහෙත් තව මත් මිථ්‍යා විශ්වාසයන් පසුපස යන කොටසක් ලෝකය තුළ වාසය කරති.  මෙම විශ්වාසයන් ලෝකයේ රටවල් අනුව විවිධාකාරයෙන් වෙනස් වී ඇත. විශ්වාස පිළිබඳ ව ගත් කල්හි එක් පිරිසකට  තමන්ගේ විශ්වාසයන් සහ ඇදහිලි සාරවත් ලෙසත්, අනෙක් අයගේ විශ්වාස සහ ඇදහිලි සාරවත් නොවන දෙයක් ලෙසත් දැකිය හැකි ය. මෙම මිථ්‍යාව වූ කලි සෑම සංස්කෘතිකාංගයක ම  පාහේ දැකිය හැකි කොටසකි. මෙලෙස නිර්මිත අතීතයේ සිට පැවත එන විශ්වාස පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ද දැකිය හැකි ය.  මෙම මිථ්‍යා  විශ්වාසයන් තුළ එලඹ පැවතීම පුද්ගලයාගේ සාර්ථකත්වය සඳහා මහත් බාධාවකි. එනම් තම වටිනා කාලය, මිල මුදල්, ශ්‍රමය, නිකරුණේ විනාශ වීමකි. මෙසේ පුද්ගලයන් විශ්වාස කරන්නා වූ මිථ්‍යා විශ්වාසයන්හි සත්‍ය අසත්‍යතාවක් පවතී ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ස්වාභාවික පරිසරයේ සිදු වන්නා වූ ඇතැම් සංසිද්ධීන් සහ සත්ත්ව හැසිරීම් මූලික කොට ගනිමින් ඒවායේ සිදු වන වෙනස්වීම්, පුද්ගල දිවිය හා සම්බන්ධ කොට ගනිමින් මෙම විශ්වාස පද්ධතිය නිර්මාණය වී ඇත. මෙසේ නිර්මිත විශ්වාසයන් කොපමණ පිරිසක් විසින් විශ්වාස කරනවා ද මේවා කොතරම් දුරට මිනිස් දිවියේ එදිනෙදා කාර්යයන්ට බලපෑම් කරන්නේ ද යන්න සොයා බැලීම හා මෙම විශ්වාසයන් කොතරම් දුරට නිවැරැදි ද මේවායේ සත්‍ය - අසත්‍ය භාවය ඔප්පු කළ හැකි ද යනාදිය පෙන්වා දීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ වර්ගය යටතේ සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ දී දත්ත එක්රැස් කිරීමට මූලික වසයෙන් ම ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය යොදා ගනු ලැබී ය. එනම්, මෙහි දී පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කවුඩුල්ල නම් ග්‍රාමයේ වයස අවු : 35ට වැඩි පිරිමි පුද්ගලයන් 13ක් හා  අවු : 35ට වැඩි කාන්තාවන් 20 දෙනෙකු නියැදියක් ලෙස ගෙන ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් තොරතුරු එක් රැස් කර ගන්නා ලදී. මේ ඇසුරින් ලබාගත් දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙහි ප්‍රතිඵල ලෙස දැකිය හැකි වූයේ, මිථ්‍යා විශ්වාස වූ කලි පුද්ගලයන්ගේ මනෝමූලික සිතුවිල්ලක් වන බවත්, මේවාට පටහැනි ව ක්‍රියා කිරීමට පුද්ගලයන් තුළ සංස්කෘතික බියක් පවතින බවත් ය. එසේ ම තව ද, මෙම ග්‍රාමය සතු ව සමාජ විද්‍යාත්මක ව පිළිගත හැකි මෙන් ම කිසිසේත් ම පිළිගත නොහැකි විශ්වාස පද්ධතියක් පවතින බවත් මෙම එක් එක් විශ්වාසයන් පුද්ගලයාගේ මානසික මට්ටම අනුව සහ පුද්ගලයාගේ සමාජ තරාතිරම අනුව වෙනස්වීම්වලට භාජනය වන බවත් දැක ගත හැකි විය. සමස්තයක් ලෙස ගත් කල මෙම පර්යේෂණය මඟින්  මෙම ග්‍රාමයේ වාසය කරන මිනිස්සු මිථ්‍යා විශ්වාසයන් කොතරම් දුරට විශ්වාස කරත් ද, ඔවුන් මෙම විශ්වාසයන් සංස්කෘතිකාංගයක් ලෙස එදිනෙදා අනුගමනය කරන්නේ ද, ඔවුන් මෙමඟින් අපේක්ෂා කරන අරමුණු කෙබඳු ද යනාදිය පිළිබඳ ව මනා නිගමනයකට එළඹිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** ඇදහිලි, ග්‍රාමීය, මිථ්‍යා, විශ්වාස, සමාජ

[1] රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, shanikanethminiliyanaarachchi@gmail.com